

# කිසිදු දේශපාලන වගකීමකින් තොරව පොදු යහපත වෙනුවෙන් ක්‍රියා කිරීම !

**වර්තමාන දේශපාලනය ඉතාමත් වාසිදායක වෘත්තියක් වී ඇත්තේ, පොදුජනතාවට අහිතකර පාඩු සහ හානි සිදුකරමින්, දේශපාලඥයන් විසින් බද්දෙන් නිදහස් සුඛෝපභෝගී වාහන, දීමනා සහ වරප්‍රසාද භුක්තිවිඳිමය. අනෙක් අතට ඊට හාත්පසින් වෙනස් ආකාරයකින් කිසිම දේශපාලඥයෙකු විසින් ගනු නොලැබූ ක්‍රියාදාමයන් අනුගමනය කරමින්, නිහාල් ශ්‍රී අමරසේකර විසින් දීර්ඝ කාලයක් මහජන අයිතීන් වෙනුවෙන් පෙනී සිටිමින්, ඔහුගේම පෞද්ගලික වියදමින් සහ උත්සාහයෙන්, රටට සහ මහජන යහපත උදේසා පහත සඳහන් කර ඇති පරිදි මහගු සේවයක් ඉටුකර ඇත.**

1. ලෝක බැංකුව, ජාත්‍යන්තර මුල්‍ය අරමුදල, ආසියානු සංවර්ධන බැංකුව වැනි ආයතනයන් වලින් දිරිගැන්වූ පෞද්ගලීකරණයන් මගින් ශ්‍රී ලංකා රජයට සිදුවූ දැවැන්ත අලාභ පිළිබඳව නිහාල් ශ්‍රී අමරසේකර විසින් ගවේෂණය කොට ප්‍රකාශයට පත්කල ලිපි 150 ක් පමණ ඔහු විසින් රචිත ග්‍රන්ථයන්හි එළිදරව් කර ඇති අතර, එයට වතු සමාගම්, එයාර් ලංකා, ශ්‍රී ලංකා ටෙලිකොම් වැනි පෞද්ගලීකරණයන්ද ඇතුලත්ව ඇත.

2. 2003 වර්ෂයේදී, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව රු. මිලියන 6,050 කට පෞද්ගලීකරණය කිරීම වෙනුවෙන් ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් සහ අර්නස්ට් ඇන්ඩ් යංග් වෙත ශ්‍රී ලංකා රජය විසින් වෘත්තීමය වන්දි වශයෙන් රු. මිලියන 170 කට වැඩි ප්‍රමාණයක් ගෙවා ඇති අතර, එහි 2018.3.31 දිනට බදු නිදහස් අගය ආසන්න වශයෙන් රු. මිලියන 990කි.

    මහජන යහපත උදෙසා නිහාල් ශ්‍රී අමරසේකර විසින් ගොනු කරවන ලද නඩු නිමිත්තක් මත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ඔහු විසින් නැවත ශ්‍රී ලංකා රජයට ලබා දුන් අතර, 2018.3.31 වන දිනට එහි වටිනාකම රු. මිලියන 100,000 ක් ඉක්ම වූ අතර; එයට ලංකා හොස්පිටල්ස් PLC සමාගම ද අයත් විය. මෙසේ සිදු වුයේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පෞද්ගලීකරණ කිරීම එස්සී (එෆ්ආර්) අංක 158/2007 දරණ නඩුවේදී ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මෙම පෞද්ගලීකරණය නීතිමය නොවන, නීති විරෝධී සහ වංචනික ලෙස සිදු කෙරුණු පෞද්ගලීකරණයක් බවට නිගමනය කරමින් එය අවලංගු කිරීමෙනි. *ගරු නීතිපතිතුමා මෙම ක්‍රියාමාර්ගයට විරුද්ධ වී ඇත.*

3. අනෙක් අතට, 2001 වර්ෂයේදී, ජාතික රක්ෂණ සමාගම පෞද්ගලීකරණය සිදු කිරීමේදී, ශ්‍රී ලංකා රජය විසින් ආතර් ඇන්ඩර්සන් එනම් ජාත්‍යන්තර වංචාවක් වූ එන්රෝන් සමාගමේ විගණනකරුවන් වූ අයට රු. මිලියන 135 ක් පමණ වෘත්තීය වන්දි ගෙවා ඇති අතර, 2018.3.31 වන දිනට බදු නිදහස් එහි වටිනාකම රු. මිලියන 920 ක් ඉක්මවා තිබූ අතර, එම කොටස් විකිණීමෙන් 2001 වර්ශයේදී ලැබ් තිබුණේ රු. මිලියන 450 ක් පමණය, එනම් වෘත්තීය වන්දි විකුණුම් වටිනාකමෙන් 30% කි !

4. 2003 වර්ෂයේදී, ලංකා අයිඕසී ලිමිටඩ් පෞද්ගලීකරණය සිදු කිරීමේදී, ශ්‍රී ලංකා රජය විසින් අර්නස්ට් ඇන්ඩ් යංග් වෙත රු. මිලියන 55 ඉක්ම වූ බදු නිදහස් වෘත්තීය වන්දි ගෙවා ඇති අතර, 2018.3.31 වන දිනට එහි වටිනාකම රු. මිලියන 305 ක් ඉක්මවන අගයක් වූ අතර, ලංකා අයිඕසී සමාගමට ඇ. ඩොලර් මිලියන 30 ක් වටිනා පුද්ගලික ඉනධන පිරවුම්හල් ඇතුලත්කර ගැනීමට ගෙවීමකින් තොරව අයිතිය පවරා තිබුණි.

    මෙම පෞද්ගලීකරණය පිළිබඳව නිහාල් ශ්‍රී අමරසේකර විසින් පසුව ගත් ක්‍රියාදාමයන්ගේ ප්‍රතිඵලයක් ලෙස, 2005 වර්ෂයේදී රු. මිලියන 5000 ක 2018.3.31 වන දිනට එහි වටිනාකම රුපියල් මිලියන 20,000 පමණ සැක සහිත 'මිල සූත්‍රයක්' මත LIOC විසින් ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා තිබූ සහනාධාර කපා හැරීමක් සහ අනාගත සහනාධාර ගෙවීමද වහාම නවත්වන ලදී. ගරු නීතිපතිතුමා මෙම ක්‍රියාමාර්ගයට සහාය දක්වා ඇත.

5. ඛනිජ තෙල් හෙජින් ගනුදෙනු මත විදේශයේදී ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සහ ශ්‍රී ලංකා රජයට ඒරෙහිව අදාල බැංකු 3 න නඩු පනවා තිබූ අවස්ථාවේදී, වාර්තා වන පරිදි රු. මිලියන 1500 ක් ඉක්මවන නඩු ගාස්තු සහ අනෙකුත් වියදම් ශ්‍රී ලංකා රජයට එම නඩු වෙනුවෙන් ගෙවීමට සිදුවී ඇත. එසේ වුයේ මහජනතාවගේ යහපත උදෙසා ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ එම නඩු විමසීමට නිහාල් ශ්‍රී අමරසේකර විසින් ගොනු කරනු ලැබූ නඩු නිමිති වලට *ගරු නීතිපති ප්‍රශ්නාගත ලෙස විරුද්ධවීම නිසාය.* එමනිසා වාර්තා වන පරිදි ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ හිමිකම වශයෙන් ඇ. ඩො. මිලියන 160 ක් සහ පොළිය ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පරාජය වූ බවත් සහ ඩොයිෂ් බැංකුවේ හිමිකම් ඇ. ඩො. මිලියන 80 ක් සහ පොළිය ශ්‍රී ලංකා රජය පරාජයට පත් වී ගෙවීමට සිදුවූ බවත්ය.

විශ්වාස කරන අන්දමට සිටි බැංකුව ඉල්ලා සිටි හිමිකම් වන ඇ. ඩො. මිලියන 192 (2018.3.31 වන දිනට එහි වටිනාකම රු. මිලියන 30,000 ක්) සහ පොළියට එරෙහිව ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ජය ගැනීමට හැකි වූයේ, නිහාල් ශ්‍රී අමරසේකර විසින් එම අවස්ථාවේදීම මෙම ඛනිජතෙල් හෙජින් ගනුදෙනු පිළිබඳව සවිස්තර ග්‍රන්ථයක් රචනා කොට ගෝලීය වශයෙන් ප්‍රසිද්ධියට පත්කිරීමෙනි. තවද ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුව විසින් ඇ. ඩො. මිලියන 160 ක හිමිකම ඇ. ඩො. මිලියන 60 දක්වා එනම් ඇ. ඩො. මිලියන 100 ක් (2018.3.31 වන දිනට එහි වටිනාකම රු. මිලියන 15,700 ක්) අඩු කර ගැනීමට හැකි වී ඇත්තේ, නිහාල් ශ්‍රී අමරසේකර විනිමය පාලක දෙපාර්තමේන්තුවට උපාය මාර්ගික උපදෙස් ලබාදීම මතය. මේ කරුණු පිළිබඳව සවිස්තරව නිහාල් ශ්‍රී අමරසේකර විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙහි (COPE / කෝප් කමිටුව) සභාපතිට පිටපතක් සහිතව, අමුණා ඇති විගණකාධිපති වෙත 2017.10.11 දිනැතිව යොමු කරනු ලැබූ ලිපියෙන් එළිදරව් වේ. තවද ඉහතකී විදේශීය නඩු තීන්දු ශ්‍රී ලංකාව තුල අධිකරණ නියෝග වලින් බලාත්මක නොකර මෙම බැංකු වෙත ගෙවීම් සිදු කලේ කෙසේද යන්න ඔහු විසින් ප්‍රශ්න නගා ඇත. (නිහාල් ශ්‍රී අමරසේකර විසින් කරවා දුන් මුළු ඉතිරිකිරීම වන්නේ ඇ. ඩො. මිලියන 292 එනම් රු. මිලියන 45,600 කි)

6. වාර්තා වී ඇති පරිදි නිහාල් ශ්‍රී අමරසේකරගේ දැවැන්ත ක්‍රියාදාමයන් මත, රජයේ ආදායම සහ අනෙකුත් පාඩු ආසන්න වශයෙන් එහි වටිනාකම රු. මිලියන 200,000 ක් 2018.3.31 වන දිනට එහි වටිනාකම රු. මිලියන 836,835 ක් කපා හැරීම වළක්වා ලමින් 'බදු සමාවක් මුවාවෙන්' බොහෝ වැරදි සහගත දේ ඇතුලත් කොට ඇති පනත 2004 වර්ෂයේදී අවලංගු කිරීමට සහ නීතියේ ආධිපත්‍යය සහ යහ පාලනය බාදනය වීම වළක්වා ගැනීමට ඔහුට හැකි විය. *ගරු නීතිපතිතුමා මෙම ක්‍රියාමාර්ගයට අඛණ්ඩව විරුද්ධ වී ඇත.* මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ ප්‍රකාශිතයේ අනෙකුත් කරුණු අතරතුර පහත පරිදි ප්‍රකාශ කර ඇත.

> *"මෙය, නීතියේ ආධිපත්‍යයට විරුද්ධවද, 'සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සහ ජාත්‍යන්තර සම්මුතිය' උල්ලංඝනය කරමින්ද තවද එමගින් මහජන දේපල විශාල සම්බාරයක් රජයට පාඩු කර ඇත."*

7. නිහාල් ශ්‍රී අමරසේකර විසින් මහජන යහපත උදෙසා ගොනු කරවනු ලැබූ *එස්සී (එෆ්ආර්) අංක 209/2007 දරණ* තවත් නඩු නිමිත්තක් කලින් කර තිබූ තවත් පෞද්ගලීකරණයක්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නීති විරෝධී, නීතිමය නොවන සහ වංචනික පදනම මත, ආයෝජන මණ්ඩල අනුමැතියෙන් සාවද්‍ය ලෙස ප්‍රධානය කර තිබූ බදු සහන අවලංගු කොට කොළඹ වරායේ ඉන්ධන සැපයුම් යටිතල පහසුකම් සහ ඒකාධිකාරය නැවත ශ්‍රී ලංකා රජයට ලබා දෙන ලද අතර, එහි වටිනාකම 2018.3.31 වන දිනට ආසන්න වශයෙන් රු. මිලියන 21,000 ක් පමණ විය. *ගරු නීතිපතිතුමා මෙම ක්‍රියාමාර්ගයට විරුද්ධ වී ඇත.*

8. නිහාල් ශ්‍රී අමරසේකර විසින් 2008 විසර්ජන පනත් කෙටුම්පත අභියෝගට ලක් කිරීමෙන් ශ්‍රී ලංකා රජය විසින් ගනු ලබන මුළු නිවැරදි ණය ප්‍රමාණය පනත් කෙටුම්පතේ දෙවන උප ලේඛනයේ අන්තර්ගත කොට එම පනත් කෙටුම්පතේ හෙලිදරව් කිරීමට නියෝග කර අතර, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 'අයවැය තුල අයවැයක්' ලෙස සඳහන් කරනු ලැබූ, අදාළ ප්‍රතිපාදන 'සංවර්ධන වැඩසටහන්' වෙනුවෙන් යොදවන ලෙස දක්වමින්, වෙනත් රහසිගත ගනුදෙනු වලට මහා භාණ්ඩාගාරය විසින් යොදා ගෙන ඇති බව ශ්‍රේෂ්ඨාධිකරණයේදී හෙලිදරව් විය. ගරු නීතිපතිතුමා මෙම ක්‍රියාමාර්ගයට සහාය දක්වා ඇත.

9. 2003 වර්ෂයේදී නිහාල් ශ්‍රී අමරසේකර විසින් මහජන යහපත සඳහා 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) සහ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත් දෙකේ සංශෝධන කෙටුම්පත් වලට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙනී සිටීමෙන් එම සංශෝධන කෙටුම්පත් දෙක ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රතික්ෂේප කර තිබූ අතර, ඉහතකී නීති දෙක සහ ප්‍රධාන ආඥාපනත් විවේචනයට ලක්කර ඇත්තේ මෙසේය: *ගරු නීතිපතිතුමා මෙම ක්‍රියාමාර්ග වලට විරුද්ධ වී ඇත.*

> "දරුණු පීඩාකාරී, අයුතු සහගත මෙන්ම නීතියේ සරණ පැතීමට ඉඩ නොදීමක් යැයි ද සඳහන් කළේය. එහිදී සඳහන් කල විශේෂ කරුණක් නම් 'නිතිය, බලවතුන් ශාක්තිමත් නොකරමින්, අසරණයන් තවත් දුර්වල කිරීමෙන් ද, වැළකිය සිටිය යුතු බවය' "

10. 1993/94 නිකුත් කළ ප්‍රශ්නකාරී ගැසට් පත්‍රයන් මගින් විනිමය පාලක සතුව තිබූ අදාළ බලය ඉවත් කර ඇති බැවින්, අපනයන ආදායම් ප්‍රේෂණ ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වීම විනිමය පාලක විසින් නියාමනය නොකරන බව නිහාල් ශ්‍රී අමරසේකර විසින් අනාවරණය කර තිබුණි. නිහාල් ශ්‍රී අමරසේකරගේ ඉල්ලීම පරිදි විනිමය පාලක විසින් *'ස්වෙච්ඡා සමීක්ෂණයක්'* සිදු කරන ලද අතර, අපනයනකරුවන්ගෙන් 50% ක් කාර්තුවක කාලය තුළ අපනයන ආදායමෙන් 81% ක් ඊළඟ කාර්තුව අවසන් වනවිට නැවත මෙරටට ගෙන්වා තිබූ අතර, එයින් 10% ක් විදේශයේ වියදම් කොට හෝ තබා ගෙන තිබූ බව පිළිගෙන ඇත. මෙය 10% ක වර්තමාන අගය කාන්දු වීමකදී ශ්‍රී ලංකාවට ඇ.ඩො. මිලියන 20,000 (රු. මිලියන 3,150,000 ක්) විදේශ විනිමය පාඩුවක් වූ අතර, 15% ක කාන්දුවීමක් නම් ශ්‍රී ලංකා රජයට ඇ.ඩො. මිලියන 30,000 (2018.3.31 වන දිනට එහි වටිනාකම රු. මිලියන 4,700,000 ක්) ඉක්මවන විදේශ විනිමය පාඩුවක් වන්නේය. මෙම ඉමහත් පාඩුව වසං වී ඇත්තේ මේ කාලය තුල විදේශ විනිමය සේවක නියුක්තයන්ගේ ප්‍රේෂණ වටිනාකම ඇ. ඩො. මිලියන 68,300 ක් වීමෙනි.

> *"චීනය සහ ඉන්දියාව වැනි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ VIII වැනි වගන්තියේ තත්ත්ව පාලන රටවල් මෙම විදේශ විනිමය නැවත සිය රටට ගෙන්වා ගැනීම සහ සමහරවිට එම රටේ මුදල් වලට හරවා ගැනීම කරණු ලබයි. නිහාල් ශ්‍රී අමරසේකරගේ ඉදිරිපත් කිරීම් මත මේ ජාතික අපරාධය 2016 දී නිවැරදි කරන ලදී. අපනයන ආදායම් ප්‍රේෂණ යළි ලබා ගැනීම නියාමනය කිරීම සඳහා විනිමය පාලක වෙත නැවත වරක් බලය පවරා ඇත. උපහාසාත්මක ලෙස, ශ්‍රී ලංකාව ඉහතකී රටවල් වලින් විදේශ විනිමය ණය ලබා ගනියි."*

- www.consultants21.com
- www.consultants21books.com

වෙබ් අඩවි තුලින් ලේඛන සාක්ෂි ලබා ගත හැක.



එස්. පී. ශ්‍රීස්කාන්ත, එල්එල්. එම් (එ.රා.)
නීතිඥ,
සොලිස්ටර් (එංගලන්තය සහ වේල්ස්)

2018.4.19

**ප්‍රශ්නාගත වන්නේ රාජ්‍ය දේපල වංචා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ ඔප්පු වූ ඉහතකී නඩු පිලිබඳව ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂිත නිර්දේශ නොසලකා අදාල පුද්ගලයන්ට එරෙහිව කිසිදු සාපරාධී ක්‍රියා මාර්ග නොගත්තේ මන්ද යන්නය ?**

**Consultants 21 Limited** PB 119
BUSINESS & MANAGEMENT ● FINANCIAL ENGINEERING & RE-STRUCTURING
ECONOMIC CRIME INVESTIGATION ● LITIGATION SUPPORT
PRIVATISATION ● PUBLIC FINANCE

167/4, Vipulasena Mawatha, Colombo 10, Sri Lanka
Tel: +94-11-2696814, +94-11-2686364, +94-11-4715988
Fax: +94-11-2697134
E-mail: consultants21@gmail.com
Website: www.consultants21.com

**පරිවර්තනයකි**

කුරියර් මගින්

2017 ඔක්තෝබර් 11

එච්.එම්. ගාමිණී විජේසිංහ මහතා, FCA, MA, (Econ), BSc (Pub.Ad) (Sp)
විගණකාධිපතිතුමා
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/72 පොල්දූව පාර
බත්තරමුල්ල.

විජේසිංහ මහත්මයාණෙනි,

## ව්‍යුත්පන්න / හෙජිං යයි හුවා දැක්වූ ගනු දෙනු

දූරකථන සංවාදයකදී රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේ (COPE) සභාපති ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති මහතා මා හට දන්වා සිටියේ ඉහත කරුණු සම්බන්ධයෙන් ඔබතුමා විසින් වාර්තාවක් සකස් කරන බවත්, මා විසින් මේ සම්බන්ධයෙන් ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳව මා විසින් ප්‍රකාශයට පත්කර ඇති පොත් දෙකේ ලේඛනගත කර ඇති නිසාත්, මා දන්නා කරුණු ඔබතුමා වෙත සැලකර සිටින ලෙසටය.

ඒ අනුව මා විසින් රචනා කල පොත් දෙකේ පිටපත් ඔබතුමාට ඉදිරිපත් කරන අතර එහි මා හට දැනගන්නට ලැබුන අදාල සියළුම තොරතුරු සහ දත්තයන් අන්තර්ගත වේ. මේ පිළිබඳ යම් පැහැදිලි කිරීමක් හෝ වැඩි විස්තර ලබාදීමක් අවශ්‍ය වුවහොත් කළ හැකි බවට දන්වා සිටිමි.

මා විසින් 2009 මැයි මස සහ ජූනි මාස වල ඉහත කරුණු සම්බන්ධයෙන් විදේශ රටවලදී නඩු කටයුතු වැලැක්වීම සඳහා අතුරු තහනම් නියෝගය ලබා ගැනීම (*anti-suit* injunctions) සඳහා පවරන ලද නඩු දෙක ඉදිරියට ගෙනයාමට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අවසර නොදෙන ලදී. ඒම නියෝගයට පදනම් වූයේ ගරු නීතිපතිතුමා විසින් 'කාල සීමාව' මත ඉදිරිපත් කළ විරෝධතා සැලකිල්ලට ගැනීම වන අතර එහිදී ගරු නීතිපතිතුමාගේ තර්කය වූයේ මෙම ගනු දෙනු මෙයට පෙර 2008 දී වෙනත් අය විසින් පවරන ලද නඩු නඩු දෙකක් අවසන් කළ 2009.01.28 දින මා ශ්‍රේෂ්ඨාධිකරණයේ සිටි බැවින් මාගේ නඩු ඉන්පසු 2009 පෙබරවාරි මස අවසානයට පෙර පැවරිය යුතුව තිබූ බව කියාපෑමෙනි. මා එදින ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙනී සිටියේ එම නඩු දෙකට මැදිහත්වීමේ අරමුණින් වුවත් එම තත්වය උදා වූයේ නැත. ගරු නීතිපතිතුමා විවෘත අධිකරණයෙහි වගකීමකින් සහතික කර සිටියේ ඔහු විසින් විදේශීය නඩු වලට එරෙහිව සාර්ථකව ජය ගෙන සම්පූර්ණ වියදම පියවා ගන්නා බවත්ය.

ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ කියා තිබූ පරිදි මා විසින් පවරන ලද නඩු දෙක 2009 පෙබරවාරි මාසයේ අවසානයට පෙර පැවරිය යුතුව තිබූ බව ප්‍රකාශ කිරීම <u>කළ නොහැකි</u> දෙයක් විය. මන්ද යත් මාගේ පළමු නඩුව පදනම් වූයේ ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව විසින් විනිමය පාලන පනත උල්ලංඝනය කරමින් 2009 මැයි මාසයේදී ඇමරිකානු ඩොලර් මිලියන 120 ක් රටින් බැහැර කිරීම නිසාය. මෙම කරුණ විනිමය පාලකතුමාගේ දිවුරුම් ප්‍රකාශයක් මගින්ද සනාථ කර ඇත. විදේශ වලදී මෙම කරුණට අදාලව නඩු පැවරීම වලක්වාලීම සඳහා මාගේ අනෙක් නඩුව පැවරුවේ 2009 ජූනි මාසයේදී විදේශ රටවල මෙම ගනු දෙනු සම්බන්ධයෙන් නඩු පැවරීමෙන් පසුවය. ඇත්ත වශයෙන්ම එක්සත් රාජධානියේ මහාධිකරණයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිතාසි ලැබුනේද 2009 ජූනි මාසයේදීය. එබැවින් මාගේ නඩු දෙක 2009 පෙබරවාරි මස අවසන් දිනට පෙර ගොණු කිරීමට තිබුනේ යැයි නිගමනය කිරීම හාස්‍යයට ලක්වන කරුණකි.

එබැවින් මාගේ ඉහතකී නඩු දෙක පවත්වාගෙන යාමට අවසර නොදී ප්‍රතික්ෂේප කිරීමේ මුසාවාද තීරණය නිසා ගරු නීතිපතිතුමාගේ සහ අධිකරණයේ වගවීම පිළිබඳ ප්‍රශ්න පැන නොනගින්නේද ?

1) ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව ඉල්ලන ලද හිමිකම ඇ.ඩො. 161,733,500/- සහ පොලිය - වර්තමාන වටිනාකම අනුව රුපියල් මිලියන 25,069 කි.

ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව විසින් ලංකා ඛනිජ තෙල් නිතිගත සංස්ථාවට එරෙහිව කල මෙම ඉල්ලීමට එක්සත් රාජධානියේ මහාධිකරණය විසින් එය ප්‍රදානය කරන ලදී. මෙහිදී නිරාවරණය වූ කරුණ වූයේ සාමාන්‍යයෙන් සිදුවන පරිදි ගරු නීතිපතිතුමාගේ උපදෙස් නොගෙන ලංකා ඛනිජ තෙල් නිතිගත සංස්ථාව පෞද්ගලික නීති සමාගමක් වන "නිත්‍ය පාට්නර්ස්" නමැති නිතිඥ සමාගමෙන් දිගටම උපදෙස් ලබාගෙන තිබීමය.

මා විසින් විනිමය පාලන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුට කරන ලද යෝජනාවක් අනුව විනිමය පාලකවරයා විසින් විනිමය පාලන පනත උල්ලංඝණය කරමින් ප්‍රාග්ධන ගිණුමෙන් මුදල් බැහැර කිරීමේ වරද මත ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවට විනිමය පාලකවරයා විසින් ඇ.ඩො. මිලියන 245 ක දඩයක් නියම කරන ලදී. මෙම නියෝගයට එරෙහිව ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව විසින් අභියාචනාධිකරණයට රිට් අයදුම් පතක් ඉදිරිපත් කරන ලද අතර එම නඩුව හේතු කොට ගෙන ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ හිමිකම ඇ.ඩො. මිලියන 60 කට අඩුකරවා ගන්නා ලදී. එනම් එය ඇ.ඩො. මිලියන 100 ක කපා හැරීමකි.

ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ ඉල්ලීමට අදාලව එක්සත් රාජධානියේ මහාධිකරණයේ නියෝගය ලංකා ඛනිජ තෙල් නිතිගත සංස්ථාව පිළිගනු ලැබුවේ කෙසේද යන්න ප්‍රශ්නය පැන නගින්නේ එම එක්සත් රාජධානියේ මහාධිකරණයේ නියෝගය ශ්‍රී ලංකාව තුල බලාත්මක කිරීම සම්බන්ධයෙන් 1921 අංක 41 දරණ ව්‍යතිෂංගික බලාත්මක කිරීමේ ආඥා පනත යටතේ මාගේ දැනුමට අනුව තීන්දු ප්‍රකාශයක් ලබා නොගෙන තිබීමය.

2) සිටි බංකුව විසින් කරන ලද ඉල්ලීම ඇ.ඩො. මිලියන 195,458,093/- සහ පොලිය වර්තමාන වටිනාකම රුපියල් මිලියන 30,296/- කි.

සිටි බැංකුව විසින් කරන ලද ඉල්ලීම බේරුම්කරණය සඳහා ලන්ඩන් ජාත්‍යන්තර අධිකරණය වෙත ඉදිරිපත් කරන ලදුව 3 දෙනකු ගෙන් සමන්විත බේරුම්කරණ විනිශ්චය සභාවක් විසින් විභාග කර මෙම ගනු දෙනු සම්පූර්ණයෙන්ම දෝෂ සහිත ගනු දෙනු ලෙස ප්‍රකාශ කරමින් ප්‍රතික්ෂේප කරන ලද්දේ ඉහතකී එක්සත් රාජධානියේ මහාධිකරණ තීන්දුව ඔවුන්ට ඉදිරිපත් කර තිබියදිත්ය.

මෙම නීති විරෝධී ව්‍යුත්පන්න / හෙජිං ගනු දෙනු පිලිබඳව මගේ පොතේ පළමුවන වෙළුම ඇමරිකා එක්සත් ජනපදයේදී පළකර ගෝලීයව බෙදා හරින ලදී. මා විශ්වාස කරන කාරණයක් වනුයේ සිංගප්පූරුවේදී පැවැත්වුන බේරුම් කරන විනිශ්චය මඩුල්ල විසින් මෙම ඔට්ටු ඇල්ලීමේ ගනු දෙනු වල නීති විරෝධී බව පෙන්නුම් කිරිම මාගේ පොතෙන් කරුණු දැනුවත්ව සිටි බවයි. එමනිසා ඇ.ඩො. මිලියන 195 ක් සිටි බැංකුවට ශ්‍රී ලංකා රජයට ගෙවීමට සිදු නොවිය.

3) ඩොයිෂ් බැංකුව විසින් කරන ලද ඉල්ලීම.

ඇ.ඩො. මිලියන 60,368,993/- සහ පොලිය වර්තමාන වටිනාකම රුපියල් මිලියන 9357 කි.

ඩොයිෂ් බැංකුව විසින් කරන ලද ඉල්ලීම අයෝජන ආරවුල් බේරුම් කිරීම සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ 3 දෙනෙකුගෙන් සමන්විත වන බේරුම්කරණ විනිශ්චය සභාවක් මගින් විභාග කරන ලදී. මෙහිදී ශ්‍රී ලංකා රජය පරාජයට පත්වූ අතර විනිශ්චය සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු ඩොයිෂ් බැංකුවට පක්ෂපාතිව තීන්දුව දුන් අතර එක් සාමාජිකයෙක් ප්‍රබල ලෙස විරුද්ධ වි ඇත.

ඇ.ඩො. මිලියන 60 ක ඔට්ටු ඇල්ලීමේ / සමපේක්ෂන හිමිකම්පෑමක්, ශ්‍රී ලංකා ජර්මානු ආයෝජන ප්‍රවර්ධන සහ අන්තර්පර්ශවීක ආවරණ ආරක්ෂා කිරීමේ ආයෝජන ගිවිසුම ලෙස අර්ථ දැක්වූයේ කෙසේද. මන්ද යත් ආයෝජනයට ආර්ථික වටිනාකමක් තිබිය යුතුය. මෙහිදී ලැබුන බහුතරයට එකග නොවූ බෙරුම්කරුගේ තීන්දුව වූයේ ඉහත කි ඔට්ටු ඇල්ලීමේ ගනු දෙනු අනුව ඩොයිෂ් බැංකුව විසින් එම ඔට්ටුවට ගෙවන්නට බැදී සිටියේ උපරීම වශයෙන් ඇ.ඩො. මිලියන 2.5 කි.

ඉහත කි ගිවිසුමේ 11(3) වගන්තියේ කියා ඇති පරිදි ශ්‍රී ලංකාවේ නිතිය අනුව එම බේරුම්කරණ ප්‍රදානය ශ්‍රී ලංකාවේ අධිකරණයේ බලාත්මක නොකළේ මන්ද යන්නය.

2016 අගෝස්තු කෝප් වාර්තාවට අනුව ඉහතකී නඩු වලට දැරීමට සිදුවූ මුළු වෘත්තිමය වන්දි මුදල සහ වියදම රුපියල් මිලියන 1,232.2 වේ. (අද දිනට වටිනාකම රුපියල් මිලියන 1,500 ඉක්මවයි ?)

මෙහිදී පැන නගින ප්‍රශ්නය වනුයේ මෙම කරුණු විමර්ශනය කිරීමට කමිටුවක් පත්කර ඇත්ද යන්න සහ මෙම මුදල ගෙවීමට කැබිනට් මණ්ඩලයේ අනුමැතියද ලැබී ඇත්ද යන්න යන්නය.

මෙයට,

හිතවත්,



නිහාල් ශ්‍රී අමරසේකර FCA, FCMA, Fellow CMA, CGMA, CFE
ඇමරිකන් නිතිඥ සංගමයේ ඇසුරු සාමාජික
දූෂණ විරෝධී බලධාරීන්ගේ ජාත්‍යන්තර සංගමයේ සම්බන්ධිකාරක
රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර සන්ධානයේ හිටපු කාරක සභික

පිටපත: ගරු සුනිල් හඳුන්නෙත්ති පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා
සභාපති
රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභාව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.